## 1.1 තත්ත්වාගණනය කළ මතය

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සහ 18 වන වගන්තිය යටතේ පවරා ඇති 1980 අංක 01 දරන කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතන නියමාවලියේ 20 වන වගන්තිය හා විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව.

- යම් අදාළ ලිඛිත නීතියකට ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කර නොතිබීම හේතුවෙන් පිරිවැය රු. 12,039,944 ක් වූ ජංගම නොවන වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබූ නමුත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | ඔබගේ නිරීක්ෂණය සමඟ එකඟ වේ.තක්සේරු වාර්තාව ලැබීම ප්‍රමාද වීම හේතුවෙන් 2019 වාර්ෂික ගිණුම් සඳහා ගැලපීමට නොහැකි විය.තක්සේරුගත අගයන් 2020 අවසන් වාර්තාවල නිවැරදිව ඇතුළත් කරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනය විසින් පාරිතෝෂිත ගණනය කිරීම සඳහා අනුගමනය කර තිබූ ප්‍රතිපත්තිය අනුව පාරිතෝෂිත නිවැරදිව ගණනය කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පාරිතෝෂිත වෙන් කිරීම රු.36,013 ක් අඩුවෙන් හා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ පාරිතෝෂිත ප්‍රතිපාදනය රු.273,589 ක් අඩුවෙන් දක්වා තිබුණි. එසේම පසුගිය වර්ෂයට සාපේක්ෂව පාරිතෝෂිත දීමනා සඳහා වූ | ඔබගේ නිරීක්ෂණය සමඟ එකඟ වේ.අදාළ වටිනාකම් 2020 අවසන් ගිණුමෙන් ගැලපීමට සටහන් කර ඇත. අදාළ අනාවරණයෙන් 2020 ගිණුම මඟින් ඉදිරිපත් කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. | පාරිතෝෂික නිවැරදිව ගණනය කළයුතු අතර අදාළ අනාවරණය කිරීම් සිදුකළ යුතුය. |

වාර්ෂික වියදම රු.4,463,622 කින් එනම් සියයට 362 ක්ද පාරිතෝෂිත සඳහා වෙන් කිරීම් රු. 5,648,563 කින් එනම්, සියයට 95 කින්ද වැඩි වී තිබුණු නමුත් මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ඇස්තමේන්තුගත දෝෂය පිලිබඳ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

## 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2014 හා 2015 වර්ෂයන්හිදී කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක වන ගොවීන්ගේ භාරකාර අරමුදල මගින් කෘෂි තාක්ෂණය ප්‍රවර්ධනය සඳහා ආයතනයේ ශිෂ්‍යයින් වෙත ලබා දී තිබූ ණය මුදලින් ශිෂ්‍යයින් 14 දෙනෙකුගේ ගිවිසුම්ගත කාලය වසර 2 සිට වසර 4 දක්වා ඉක්මවා තිබූ එකතුව රු.1,457,175 ක ණය මුදල් සමාලෝචිත වර්ෂයේ අවසාන දින දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | එකඟ වේ.විගණන හා කළමනාකරණ කමිටුවේ නිර්දේශ මත මෙම මුදල් අයකර ගැනීම සඳහා ණය ගැණුම්කරුවන්ට සහ ඇපකරුවන්ට නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බවට සිහිකැඳවීම් යවා ඇත. | අදාළ ණය මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.6.2 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371 ට අනුකූල නොවන ලෙස සමාලෝචිත වර්ෂය තුළදී අවස්ථා 03 කදී මාණ්ඩලික නොවන නිළධාරීන් වෙත එකතුව රු.154,900 ක අත්තිකාරම් ලබා දී තිබූ අතර 2019 දෙසැම්බර් 18 දිනට එකතුව රු.240,000 ක අත්තිකාරම් පියවීමට දින 30 ත් දින 140 ත් අතර කාල පරාසයක් ගත වී තිබුණි. | ආයතනයේ මාණ්ඩලික නිලධාරින් දෙදෙනෙකු පමණක් සිටින බැවින් කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය මත අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරින් තිදෙනෙකු වෙත අත්තිකාරම් ලබාදීම සිදුකරනු ලබයි.සේවක වැඩ වර්ජනය සහ අයහපත් කාලගුණ තත්ත්වය හේතුවෙන් පැල ඇණවුම් කිරීම ප්‍රමාද කිරීම මෙම අත්තිකාරම් පියවීමේ ප්‍රමාදයට හේතු වී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2008 ඔක්තෝම්බර් 16 දිනැති අංක 157 1/15 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ 5 (ii) සහ 5 (iii) වගන්ති | නියමාවලිය අනුව ශාස්ත්‍රීය මණ්ඩලයක් සහ අධ්‍යයන මණ්ඩලයක් පිහිටුවීමට කටයුතු කර නොතිබුණි. | එකඟ වේ.2008 අංක 02 දරන ආඥා පනතේ 13 වන කොටසේ ශාස්ත්‍රීය මණ්ඩලයක් සඳහා අවශ්‍ය සංයුතිය දක්වා ඇති අතර අවශ්‍ය සාමාජික සංඛ්‍යාව නොමැති වීම මත මෙම ශාස්ත්‍රීය මණ්ඩලයක් හා අධ්‍යයන මණ්ඩලයක් පිහිටුවීම සිදුකිරීම අපහසුය. | කඩිනමින් අවශ්‍ය අනුමැතිය මත ශාස්ත්‍රීය හා අධ්‍යයන මණ්ඩලය පිහිටුවීම සිදු කළ යුතුය. |
| (ආ) 1995 ජුලි 14 දිනැති අංක 636 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | විභාග පැවැත්වූ දින සිට මාස 03 ක කාලයක් ඇතුළත එහි ප්‍රතිඵල නිකුත් කළ යුතු වුවත් වර්ෂයේ ආයතනය 2019 04 විසින් පැවැත්වූ විභාගක් සඳහා ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා මාස ත් 2/1 2 ත් 02 මාද වීඅතර කාලයක් ප්‍රතිබුණි. | එකඟ වේ.අධ්‍යයන කාර්ය මණ්ඩලයට වැඩ අධික වීම මත මෙම තත්ත්වය ඇති වී තිබෙන අතර ප්‍රමාද වී ප්‍රතිඵල ලබාදෙන අය විභාග දීමනා සඳහා සුදුසුකම් නොලබයි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.6,993,247 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.4,019,352 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,973,895 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට නිෂ්පාදන කටයුතුවල අලාභයක් ලැබීමත් ,වැටුප් වියදම වර්ධනයත් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ආයතනයේ ප්‍රධාන මෙහෙයුම් කටයුත්ත වන පටක රෝපණ නිෂ්පාදන නිපදවීම හා විකිණීම මඟින් 2018 හා 2019 වර්ෂයන්හිදී පිළිවෙලින් රු.1,422,395 ක හා රු. 12,370,640 ක අලාභයන් ලබා තිබූ අතර 2018 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී එම අලාභය රු.10,948,245 කින් එනම් සියයට 770 කින් වැඩි වී තිබුණි. මේ සඳහා සේවක වැටුප් ඉහළ යාම හා අලෙවිය පහළ යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණ ද අලෙවිය ඉහළ නැංවීමේ වැඩ පිළිවෙලක් කළමනාකරණය ක්‍රියාත්මක කර නොතිබුණි. | එකඟ වේ.මෙම තත්ත්වයට පසුගිය වර්ෂයට සාපේක්ෂව සෘජු ශ්‍රමික වැටුප් පිරිවැය ඉහළ යාම,විකුණුම් ආදායම සියයට 48 කින් සහළ යාම සහ කෙසෙල් පටක රෝපණ සඳහා ඉල්ලුම විචලනය වීම මූලිකව බලපාන ලදී. | ප්‍රධාන මෙහෙයුම් ආදායම් වර්ධනය කරගැනීම සඳහා අවශ්‍ය වැඩ පිළිවෙලක් හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |